www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ප්‍රන්සයේ සමාජ ව්‍යාපාර: පසු ගිය දස වසරේ දේශපාලන පාඩම්

## පලමු වන කොටස

**The social movements in France: Political lessons from the last 10 years**
**Part 1**

**පීටර් ෂ්වාස් විසිනි**
**2006 ජුනි 14**

*අප්‍රේල් 17 සිට අප්‍රේල් 21 දක්වා බර්ලින් නුවර දී ජර්මනියේ සහ මහා බ්‍රිතාන්‍යයේ සමාජවාදී සමානතා පක්ෂ විසින් පවත්වන ලද සම්මන්ත්‍රනයකට පහත සඳහන් දේශනය පවත්වන ලද්දේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩල සාමාජික පීටර් ෂ්වාස් විසිනි. එය කොටස් දෙකකින් පල වේ.*

වසර දෙසීයකට වැඩි කාලයක් පුරා ප්‍රන්සය දැකගනු ලැබ ඇත්තේ පන්ති ප්‍රතිසතිතාවන් වඩා විවෘතව පොරබදනු ලැබූ හා යුරෝපීය පරිමානයේ පලවිපාක ගෙන දුන් සිද්ධීන්වලට සමාජ ගතිකය සම්පාදනය කලා වූ භූමිය වසයෙනි. 1789 සිට 1815 දක්වා විප්ලවීය කාල පරිච්ඡේදයට ද නැවත 1831, 1848, 1871 සහ අවසන් වසයෙන් පැරිසියේ ආරම්භ වී සමස්ත යුරෝපය පුරා ලැව්ගින්නක් මෙන් පැතිර ගිය මැයි-ජුනි කැරැල්ල සිදු වූ 1968 වසරට ද මෙය එක සේ අදාල වේ.

පසු ගිය මාස දෙක තුල ප්‍රන්සය සොලවා ලූ ඊනියා "ප්‍රථම රැකියා ගිවිසුම" වටා හටගත් එම වර්ගයේ ගැටුම්වලට ද, ප්‍රන්ස දේශ සීමාවන්ගෙන් බොහෝ ඈතට දිවයන අර්ථභාරයක් පවතී. ආදර්ශමත් විලාසයකින් ඒවා පෙන්නුම් කරන්නේ යුරෝපයේ පවත්නා සැබෑ සමාජ හා දේශපාලනික කොන්දේසි ය. උදාහරනයක් ලෙස ජර්මානුවන්ට වඩා ප්‍රන්ස ජනතාව ඓතිහාසික සම්ප්‍රදාය මත පදනම්ව මිලියන ගනනින් වීදිවලට බැසීමේ වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන්නේ වී නමුත් එම පුපුරන සුලු ආතතීන් සහ දේශපාලන ගැටුම් මෙහි ද, යුරෝපයේ සෙසු ප්‍රදේශවල ද, ක්‍රියාකාරී වෙති.

ජාත්‍යන්තර මූලෝපායික අත් දැකීමක් නියෝජනය කරන ප්‍රන්සයේ සිද්ධීන් ප්‍රවේශම් සහගත විශ්ලේෂනයක් ඉල්ලා සිටී. ප්‍රන්සයේ තරුනයන් ද කම්කරු පන්තිය ද මුහුන දෙන ගැටලුවලට ජාතික විසඳුමක් ඇත්තේ නැත. එහි සියලු තීව්‍රතාවන් සහිතව ප්‍රථම රැකියා ගිවිසුම් අරගලය ඉස්මතු කරන්නේ සමාජවාදී ඉදිරි දර්ශනයක පදනම මත නව විප්ලවවාදී නායකත්වයක් ගොඩනැගීමේ කර්තව්‍යය යි.

මෑත සිද්ධීන්වලට ප්‍රබල ලෙස මැදිහත් වූ ලෝක සමාජවාදී වෙබ්අඩවිය (ලෝසවෙඅ) එහි කටයුතුවල හරි මැදින් තැබුවේ, මෙම වර්ධනයන් ය. කර්තෘ මන්ඩලයේ සාමාජිකයින් ගනනාවක් ම අඛන්ඩව පැරිසියේ වැඩ කලහ. දෛනික පදනමක අද්‍යතන සිද්ධීන් විශ්ලේෂනය කල අපි, ප්‍රන්ස සහ ඉංග්‍රිසි භාෂා දෙකෙන් ම ලිපි පල කලෙමු. වෘත්තීය සමිති සහ විවිධ දේශපාලන ප්‍රවනතාවල භූමිකාව විභාග කල අපි, 1936 මහජන පෙරමුන සහ 1968 ජෙනරල් ස්ට්‍රයිකය වැනි ඓතිහාසික සිදුවීම්වල පාඩම් අවධානයට ලක් කලෙමු.

පැරනි ප්‍රතිසංස්කරනවාදී සංවිධානයන්ගෙන් කැඩී වෙන්වීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීමේ දී ද, එම සංවිධාන සඳහා තමන් විසින් කවරයක් සම්පාදනය කල සුලු ධනේශ්වර රැඩිකල් කන්ඩායම්වල භූමිකාව හෙලිදරව් කිරීමේ දී ද, අපගේ වැඩ කටයුතුවල කේන්ද්‍රීය කාරනාව වූයේ දේශපාලනික විඥානය ඔසවාලීම යි. එසේ කිරීම මගින් හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (හජාජාක) ප්‍රන්ස ශාඛාවක් ගොඩනැගීමේ පදනම් ස්ථාපනය කිරීම අපි අරඹා ඇත්තෙමු.

### "අන්ත වම" සහ ප්‍රථම රැකියා ගිවිසුමට එරෙහි අරගලය

ජාත්‍යන්තර කමිටුව හැරුනු විට, එවැනි කර්තව්‍යයන් භාරගැනීම සඳහා උත්සාහ දරන වෙන එකදු දේශපාලන ප්‍රවනතාවක් වත් ප්‍රන්සයේ තිබුනේ නැත. ආන්ඩුව ප්‍රථම රැකියා ගිවිසුම අකුලා ගැනීමෙන් පසුව, අරගලය විසින් ඉස්මතු කරන ලද මුඛ්‍ය දේශපාලන ගැටලු සඟවාලීමේ එල්ලය සහිත ප්‍රකාශන්, ඊනියා "අන්ත වමේ" පක්ෂ වන විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (එල්සීආර්), ලුතේ උව්රියරේ (කම්කරු අරගලය - එල්ඕ) සහ කම්කරු පක්ෂය (පීටී) - විසින් පල කලහ.

මෙම සංවිධාන තුන ම ප්‍රථම රැකියා නීතිය හකුලා ගැනීම ප්‍රධාන ජයග්‍රහනයක් ලෙස හුවා දැක්වී ය.

කම්කරු පන්තිය තම ව්‍යාපාරය ප්‍රමානාත්මකව ප්‍රසාරනය කලහොත් සහ තම "සමගිය" පවත්වා ගතහොත් එහි සියලු ඉල්ලීම් දිනා ගත හැකි බව ඔවුන්ගේ ප්‍රධාන දේශපාලන නිගමනය විය. මෙම සමගියෙන් ඔවුන් අදහස් කලේ වෘත්තීය සමිති සමග එකමුතුවයි. සමාජවාදී ඉදිරිදර්ශනයන් පසෙකින් තැබුව ද, නව දේශපාලන දිශානතියක් පිලිබඳ ප්‍රශ්නය ඔවුන් කිසිවෙක් ඉස්මතු කලේ නැත. තව ද ඔවුන් කිසිවෙක් ප්‍රන්ස දේශසීමාවන්ගෙන් ඈතට දිවයන වැඩ පිලිවෙලක් ඉදිරිපත් නොකලහ. ඔවුන්ට ප්‍රන්සයෙන් පිටත ලෝකයක් නොපවතී. ඔවුන් කිසිවෙක් වෘත්තීය සමිති සහ ප්‍රතිසංස්කරනවාදී පක්ෂ විවේචනය නොකලාහ. සැර බාල කර මතු කල විවේචන පවා, සම්පූර්නයෙන් ම උපායික ගනයට යටත් කරනු ලැබින. කෙටියෙන් කිවහොත් මෙම සංවිධාන තුන ම අදූරදර්ශී, පරිපූර්නයෙන් ම වෘත්තීය සමිතිවාදී වූ ජාතිකවාදී ඉදිරිදර්ශනයන් ආරක්ෂා කරති.

උදාහරනයක් ලෙස, ප්‍රථම රැකියා නීතිය හකුලා ගැනීම පිලිබඳව එල්සීආර් සංවිධානය මෙසේ ලිවී ය: "ආර්ථික අනාරක්ෂිතභාවයට හා විරැකියාවට එරෙහි සැබෑ පියවරයන් ක්‍රියාත්මක කිරීම එල්ලය කරගත්, තරුනයන්ගේ, වැටුප් උපයන්නන්ගේ සහ සමස්ත ජනතාවගේ පොදු ව්‍යාපාරයක් සඳහා යන ගමනේ දී මෙම සාර්ථකත්වය ප්‍රථම තීරනාත්මක පියවරකි. තරුන ව්‍යාපාරය මාවත විවෘත කලහ. අරගලය වාසි ලබන්ට පටන් ගත්තේ එය ප්‍රජාතාන්ත්‍රික සහ දේශපාලනික ස්වරූපයක් අත්කර ගනිමින් ආයතන ව්‍යුහය ප්‍රශ්නයට ලක් කරමින්, බෙදීම් ඉක්මවා, කම්කරුවන් සහ විවිධ පරම්පරාවන් එක්සත් කරන කල්හි ය."

මෙම ඡේදය එහි කූටප්‍රාප්තියට ලඟා වූයේ "වෘත්තීය සමිතිගත සකල සංවිධාන" තවදුර ඉල්ලීම් ක්‍රියාවට දැමීම සඳහා දුන් "පොදුවේ බලමුලුගැන්වීමක් සූදානම් කල යුතු ය" යන ඉල්ලීම තුලිනි.

තමන්ගේ පැත්තෙන් ලුතේ උව්රියරේ මෙසේ නිවේදනය කලේ ය: "ප්‍රථම රැකියා ගිවිසුම හකුලා ගැනීමට බලකරනු ලැබූ වීදිවල අරගල, ඉදිරිමාවත පෙන්වමින් සියල්ලට ම ඉහලින් එය සාර්ථකත්වයට පත් කලේ ය. සමාජ අර්බුදය නවතාලිය හැකි එකම මාවත වන්නේ හාම්පුතුන් සහ ආන්ඩුව පසු බැස්සීමට කම්කරුවන් සතු සමාජ බලය වන පෙලපාලි සහ වැඩ වර්ජන යොදා ගනිමින් අරගලයේ යෙදීමයි."

"වෘත්තීය සමිති සමග කම්කරුවන්ගේ සමගිය" වෙත සාර්ථකත්වය ආරෝපනය කල පීටී සංවිධානය අති මූලික ගැටලුව වන්නේ සමගිය ය යන්න කිහිපවතාවක් ම අවධාරනය කලා ය.

මෙම සංවිධාන තුනෙන් යුරෝපා සංගමය පිලිබඳ ගැටලුව ඉස්මතු කලේ පීටී සංවිධානය පමනි. "අති මූලික ඉල්ලීම් තෘප්තිමත් කර ගැනීමේ මාවත විවෘත කිරීමේ පදනම වැටෙනු ඇත්තේ යුරෝපා සංගමයෙන් බිඳීමේ අවශ්‍යතාව සමග ය." කෙසේ වුවද යුරෝපා සංගමයට පීටී සංවිධානයේ විකල්පය වන්නේ යුරෝපා කම්කරු පන්තියේ සමගිය සහ එක්සත් යුරෝපා සමාජවාදී සමූහාන්ඩුවක් නොව, ප්‍රන්ස රාජ්‍යය සඳහා පර්යාය පදයක් ලෙස "ප්‍රජාතන්ත්‍රවාදය" යොදා ගන්නා, ප්‍රන්සය තුල "ප්‍රජාතන්ත්‍රයයි". මැයි මස අග දී "යුරෝපා සංගමයෙන් බිඳීම සඳහා ද, ප්‍රජාතන්ත්‍රවාදය යලි අත් කර ගැනීම සඳහා ද" යන සටන් පාඨය යටතේ පැරිසියේ දී, මෙම සංවිධානය විසින් විශාල රැලියක් පවත්වන ලදී.

මෙම ජාතිකවාදී, වෘත්තීය සමිති ලැදි ඉදිරි දර්ශනය ප්‍රතිගාමී වන අතර, එය පෙන්නුම් කරන්නේ වර්තමාන යථාර්ථය සමවබෝධ කර ගැනීමේ අත්‍යන්ත නොහැකියාවකි. මෙවැනි ඉදිරි දර්ශනයක් ගෙන එනු ලබන්නේ 1960 හෝ 1970 ගනන්වල නොව, 2006 දී ය. යුරෝපය පුරා සුභසාධන කප්පාදු කිරීමේ වසර ගනනාවකට ද, චීනයේ සහ ඉන්දියාවේ මිලියන ගනනක් වූ අඩු වැටුප් කම්කරුවන්, ලෝක නිෂ්පාදනයට සංග්‍රහිත කර ගැනීමේ ද, ගෝලීයකරනයේ දියුනු අවධියක දී මෙම සංවිධාන තුන ම ඒකමතියෙන් කියන්නේ: "කම්කරුවන් කල යුතුව ඇත්තේ තම අරගලය වැඩි දියුනු කිරීම පමනි, එවිට සමාජ අර්බුදය නතර කල හැකි ය."

එවැනි ආකල්පයන් හුදෙක්, මෝහය හෝ බොලඳකම පිලිබිඹු කරනවා නො වේ. වෘත්තීය සමිති අරගලයට පලිප්පු දැමීමේ එල්ලය වන්නේ, සමිති තන්ත්‍රය සහ නිල "වාමාංශය" ආරක්ෂා කිරීමත්, මහජන ව්‍යාපාරය ඒවා පසුපස ගාල් කිරීමත් ය.

පසු ගිය වසර දහය පුරා ප්‍රන්සය තුල, මිලියන ගනනකගේ බලමුලුගැන්වූ මහජන ව්‍යාපාර මාලාවක් පැවතී ඇත. ඒ සෑම අවස්ථාවක දී ම, වෘත්තීය සමිති සහ නිල වාමාංශික පක්ෂ, මහජන ව්‍යාපාරය භේද කිරීමේ හා, පවත්නා ධනේශ්වර පර්යාය ආරක්ෂා කිරීම සඳහා උත්සාහ දරා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස එම සංවිධාන දරුනු ලෙස අපකීර්තියට පත්ව දුර්වල වී ඇත. ප්‍රන්සයේ නිල වෘත්තීය සමිති සාමාජිකත්වය කම්කරු ජනකායෙන් 8% මට්ටමේ පවතින අතර, එය යුරෝපයේ එවන් අඩුම එකකි. 2002 මැතිවරනයේ දී නිල වාමාංශික පක්ෂ (සමාජවාදී පක්ෂය - පීඑස් හා කොමියුනිස්ට් පක්ෂය - පීසීඑෆ්) දරුනු පරාජයකට මුහුන දුන්නේ ය.

පසු ගිය දශකයේ සමාජ ව්‍යාපාරයන්ගෙන් උකහාගැනීමට ඇති එක් කේන්ද්‍රීය පාඩමක් වේ නම් ඒ, කම්කරු පන්තිය, ජරපත් වෘත්තීය සමිති සහ ප්‍රතිසංස්කරනවාදී සංවිධානවලින් බිඳී තමන්ගේ ම ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවයි. "අන්ත වාමාංශයේ" කන්ඩායම්වල

භූමිකාවට, මෙම කුනු වූ සංවිධාන සමග වන දේශපාලනික භේදය වැලැක්වීම ද, වත්මන් ආන්ඩුව බිඳ වැටුනහොත්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ (පීඑස්) අනුග්‍රහය යටතේ "වාම ආන්ඩුවක" නව රූපාකාරයක් බලයට ගෙන ඒමට උදව් දීම ද, අඩංගු වේ.

ප්‍රන්සයේ සිද්ධි සුපැහැදිලිව පෙන්නුම් කරන්නේ, කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයකට පදනම සම්පාදනය කල හැක්කේ, ලෝසවෙඅට සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට පමනක් බවයි. අනෙක් සියලු ප්‍රවනතා මෙය ප්‍රතික්ෂේප කරති. කර්තව්‍යය වන්නේ ස්වයංසිද්ධ ව්‍යාපාරයේ වඩාත් රැඩිකල් අංශයේ භූමිකාව රඟදැක්වීම නොව, සිද්ධීන් පිලිබඳ දේශපාලනික අවබෝධය නගාසිටුවීමත්, සමාජවාදී විඥානය වර්ධනය කිරීමත්, ඉතිහාසයෙන් අවශ්‍ය පාඩම් උකහා ගැනීමත් ය.

විප්ලවවාදී නායකත්වයේ හා දිශානතියේ අර්බුදය, පසු ගිය දශකයේ සිද්ධීන්ගේ කේන්ද්‍රීය හා අනුල්ලංඝනීය තේමාවක් ලෙස ඉස්මතු වේ. ඒ සමග ම අර්ථභාරී නව වර්ධනයන් ද නිරීක්ෂනය කල හැක. පලමුව පැරනි ප්‍රතිසංස්කරනවාදී සංවිධානවලින් සහ සුලුධනේශ්වර රැඩිකලුන්ගෙන් (එල්සීආර්, එල්ඕ) බෙහෙවින් විකර්ශනය වූ නව ස්ථරයන් අරගලයට ඇතුල් වෙමින් සිටිති. දෙවනුව, ප්‍රතිසංස්කරනවාදී පක්ෂ සහ වෘත්තීය සමිති වඩ වඩාත් අපකීර්තියට පත්ව ඇත. තෙවනුව, තියුනු ලෙස දකුනට චලනය වී ඇති "වාම" කන්ඩායම් මත රඳා සිටීමට පාලක ප්‍රභූවට බල කෙරෙමින් තිබේ.

මෙම වර්ධනය ස්වයං සිද්ධව විප්ලවවාදී නායකත්වයේ අර්බුදය නො විසඳන අතර ඒ වෙනුවට එය වඩා තීව්‍ර හා තියුනු ආකාරයකින් ඉදිරිපත් කරයි. පැරනි ප්‍රතිසංස්කරනවාදී සංවිධානවල පිරිහීම සහ රැඩිකල් කන්ඩායම් ධනේශ්වර පද්ධතියට ඒකාග්‍රවීම කෙතරම් ආන්තික ස්වරූපයක් ගෙන තිබේ ද යත් අප හැරුනු විට ධනේශ්වර කඳවුරට එරෙහි වන වෙනත් කිසිදු බලවේගයක් ඇත්තේ නැත. එහි අර්ථය, ඉහල ම දේශපාලන වගකීම් සම්භාරයකට මුහුන දීමට අපට සිදුව ඇති බවයි.

දැන් අපි කාලානුරූපව පසු ගිය දශකයේ වර්ධනයන් කෙටියෙන් විභාග කර බලමු.

## 1995 නොවැම්බර්/දෙසැම්බර් වැඩ වර්ජන ව්‍යාපාරය

1985 අගභාගයේ දී , ඇලන් ජුප්පේ සහ ජනාධිපති ජැක් චිරක්ගේ දක්ෂිනාංශික ආන්ඩුවට එරෙහි සති තුන හමාරක් පුරා දිග් ගැසුනු වර්ජනයකට කම්කරුවන් ලක්ෂ ගනනක් අවතීර්න වූහ. දසලක්ෂ ගනන් සහභාගී වූ පෙලපාලි පැවැත්විනි. ව්‍යාපාරය යොමුව පැවතියේ ආන්ඩුව විසින් සමාජ ආරක්ෂන ප්‍රතිලාභ, විශ්‍රාම වැටුප්, සෞඛ්‍ය රක්ෂනය සහ රැකියා මතට එල්ල කරන ලද ප්‍රහාරවලට එරෙහිව ය. එහි අරමුන වූයේ යුරෝපය පුරා ප්‍රහාරයට ලක්ව තිබුනු පශ්චාත් යුද කාලීන සමාජමය ජයග්‍රහන ආරක්ෂා කර ගැනීම යි. සෝවියට් සංගමය බිඳ වැටී පස් වසරක් ගතවන විට, තමන් පශ්චාත් යුද්ධ යුගයේ පන්ති ගැටුම් සමනය කිරීමට හා මර්දනය කිරීමට භාවිතා කර තිබුනු එම සමාජමය සහන තව දුරටත් පවත්වාගෙන යාමේ කිසිදු අවශ්‍යතාවක් යුරෝපා ධනේශ්වරයට නො පෙනින.

මහජන ව්‍යාපාරයේ කේන්ද්‍රයේ සිටියේ දුම්රිය, ප්‍රවාහනය, විදුලිබල අංශය, තැපැල් සේවය, සහ නාගරික ආයතනවල රාජ්‍ය සේවයේ කම්කරුවන් ය. මෙම අංශවල කම්කරුවන් සාපේක්ෂව වැඩි අනුපාතයක් වෘත්තීය සමිතිගතව සිටියහ. කෙසේ වුව ද මහජන ව්‍යාපාරයේ ධාවක බලය වූයේ වෘත්තීය සමිති නො වේ. ඒ වෙනුවට වෘත්තීය සමිති තම කර්තව්‍යය ලෙස දැක ගත්තේ විරෝධතා සහ වැඩ වර්ජන පාලනය කර ගැනීමත්, ඒවා ආන්ඩුවට තර්ජනය කල හැකි දේශපාලන ව්‍යාපාරයක් බවට වර්ධනය වීමෙන් වැලැක්වීමත් ය.

"අන්ත වම" ඔවුන්ගේ පැත්තෙන් වෘත්තීය සමිති නිලධරයේ කුලී හේවායන්ගේ භූමිකාව භාර ගත්හ. ගනන් නැති වර්ජන රැලිවල දී වෘත්තීය සමිති නියෝජිතයා අසලින් ම එල්සීආර් හෝ එල්ඕ වෙතින් පැමිනි කථිකයෙක් නිරන්තරයෙන් සිටි අතර, ඔහු හෝ ඇය සමිති නියෝජිතයාට නොවලහා සහයෝගය පල කරමින්, එම දේශපාලන පටිපාටිය ම ඉදිරිපත් කලේ ය.

අවසානයේ දී ජුප්පේ සමග කුනු වූ සම්මුතියකට එකඟ වුනු වෘත්තීය සමිති වර්ජන ව්‍යාපාරයේ හුස්ම හිර කර දැමූහ. මෑත දී ඇති වූ ප්‍රථම රැකියා ගිවිසුම පිලිබඳ අර්බුදයට සමාන ආකාරයකින්, ජුප්පේ ආන්ඩුව තම සැලසුමේ වඩාත් මතභේදාත්මක කොටස් හකුලා ගෙන අනෙක් සියලු අංශ තිබෙන්නට ඉඩ හැරියේ, ජුප්පේට තනතුරේ දිගටම සිටීමට ඉඩ දී ආන්ඩුවේ ක්‍රමානුකූල මාරුවක් සඳහා අවශ්‍ය කාලය චිරක්ට ලබා දෙමිනි.

## ජොස්පින් ආන්ඩුව

1995 වර්ජන ව්‍යාපාරය මගින් ජුප්පේ ආන්ඩුවේ අධිකාරයට කෙතරම් වලකැපුනේ ද කිවහොත් 1997 වසන්තයේ දී පාර්ලිමේන්තුව නියමිත කලට පෙර විසුරුවා නව මැතිවරනයක් කැඳවීමට චිරක් තීන්දු කලේ ය. මෙම අදහස ඉදිරිපත් කිරීමේ වරද පැටවෙන්නේ වත්මන් අගමැති හා එවකට ජනාධිපති කාර්යාල ප්‍රධානී ඩොමිනික් ඩි විලෙපින්ට ය.

දක්ෂිනාංශයේ බහුතරය අහිමි වී යාමට බොහෝ ඉඩකඩ තිබුනු මෙම පියවර ගැනීමට චිරක් සහ

විලෙපින් පෙලඹවූයේ කුමක් ද යන්න පිලිබඳව සැලකිය යුතු මතිමතාන්තර පවතී. ඉහල පැලැන්තියේ විලෙපින්, මෑත දී පෙන්නුම් කර ඇති පරිදි මහජන මතය සම්බන්ධයෙන් විශේෂයෙන් ම අසංවේදී ය. එම නිසා ඔහුගේ පැත්තෙන් ගත් විට එය වැරදි ගනන් බැලීමකි. කෙසේ වුවද වඩාත් විය හැකි දෙය වන්නේ කම්කරු පන්තිය මත පාලනය තබා ගැනීමේ හොඳ ම ක්‍රමය ලෙස විරැක් සහ විලෙපින්, වාමාංශික පක්ෂවල මැතිවරන ජයග්‍රහනයක් පිලිගැනීමට දැනුවත්ව ම සූදානම්ව සිටි බවයි.

සමාජවාදී පක්ෂයේ ජනාධිපති ප්‍රන්සුවා මිතරොංගේ යුගය අවසාන වූයේ යන්තම් වසර දෙකකට කලින් වූ අතර එම යුගය තුල "සමාජවාදීන්" සහ කොමියුනිස්ට් පක්ෂය දැඩි ලෙස අපකීර්තියට පත්ව තිබුනි. එම නිසා පාලක ප්‍රභුව වාම මුහුනුවර පවත්වාගෙන යාම සඳහා රඳා පැවතියේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයෙන් පලා ගිය භ්‍රෂ්ටයකු මතයි. අනාගත අගමැති වූ ලයනල් ජොසපින්ගේ චරිතය හරහා එක් කලෙක හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාව වූ එපෙර් ලැම්බර්ට්ගේ නායකත්වයෙන් යුත් ජාත්‍යන්තර කොමියුනිස්ට්වාදී සංවිධානය (ඕසීඅයි - අද්‍යතන පීටී) තුල තම ජීවිතකාලයෙන් අඩු ම තරමින් වසර 20ක් වත් ගත කල අයෙක් ආන්ඩුවේ ප්‍රධාන තනතුරට ගෙන ඒමට ධනේශ්වරය කටයුතු කලේ ය.

1964 දී ප්‍රභු පැලැන්තියේ උසස් සිවිල්සේවා පාසලේ (ඊඑන්ඒ) ශිෂ්‍යයකුව සිටිය දී ඕසීඅයි සංවිධානයට බැඳුනු ජොස්පින්, 1972 දී සමාජවාදී පක්ෂයට ඇතුලත් විය. ඉක්මනින් ම මිතරොංගේ සමීප සහායකයන්ගෙන් එකකු බවට පත් වූ ඔහු, ජාතික දේශපාලනයේ නායකත්වය කරා නැග ගත්තේය. අවම වසයෙන් 1980 ගනන්වල ආරම්භය දක්වා ඔහු ඕසීඅයි සංවිධානයේ විනයට යටත්ව වැඩ කරගෙන ගියේ ය.

ජොස්පින්ගේ දේශපාලන චරිත ලක්ෂන වර්ධනය වූයේ ඕසීඅයි සංවිධානය හජාජාක ඉදිරිදර්ශනයෙන් ඉවතට හැරෙමින් සිටි අවස්ථාවකදී යː අවසානයේ දී එය සමාජ ප්‍රජාතන්ත්‍ර නිලධරය සඳහා මුක්කුවක් ලෙස මතුවිය යුතුව තිබුනි.

1960 ගනන්වල, මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩෙල්ගේ සංශෝධනවාදයට එරෙහිව ජාත්‍යන්තර කමිටුව (ජාක) දියත් කල අරගලයේ යුක්තියුක්තභාවය ප්‍රශ්නයට ලක් කිරීමට ඕසීඅයි සංවිධානය පටන් ගෙන තිබුනි. මෙම මාරුව මූලිකව ම ප්‍රකාශිත වූයේ හතරවන ජාත්‍යන්තරය මිය ගොස් ඇතැයි ඕසීඅයිය විසින් ප්‍රකාශ කිරීම තුලය. ඕසීඅයි හි ආස්ථානය වූයේ පැබ්ලෝවාදය විසින් හතරවන ජාත්‍යන්තරය විනාශ කරනු ලැබ ඇති බැවින් නව පදනමක් මත එය යලි ගොඩනගනු ලැබිය යුතු බවයි. 1966 දී පැවති ජාත්‍යන්තර කමිටුවේ තුන්වන ලෝක සම්මේලනයේ දී ඕසීඅයි සංවිධානය, හතර වන ජාත්‍යන්තරය "යලි ගොඩනැංවීම" පිලිබඳව අවධාරනයෙන් කතා කලා ය.

මෙම ආස්ථානය මාධ්‍යමික බලවේගයන් සඳහා වූ පොදු දේශපාලනික ක්ෂමාලාපයකට සමාන විය. පැබ්ලෝවාදය සමග ගැටුමේ දී ආරක්ෂා කොට තිබුනු දේශපාලන මූලධර්ම සමග සමග එකඟ වීම හෝ ප්‍රතික්ෂේප කිරීමට ඔවුන් ඉදිරිපත් නොවුනත් පොදුවේ "හතර වන ජාත්‍යන්තරය යලි ගොඩනැගීමට" සහාය පල කල සියලු දේශපාලනික ප්‍රවනතා සමග සහයෝගීවීමකට ආරාධනාවක් එමගින් නියෝජනය විය.

ජාත්‍යන්තර කමිටුව තියුනු ලෙස මෙම ආස්ථානය ප්‍රතික්ෂේප කලා ය. ජාත්‍යන්තර කමිටුවේ බ්‍රිතාන්‍ය ශාඛාව වූ සමාජවාදී කම්කරු සංගමය (එස්එල්එල්), 1967 දී ඕසීඅයි වෙත මෙසේ ලිවී යː "ධනවාදයට සහ නිලධාරි තන්ත්‍රයන්ට එරෙහිව අරගලයට ඇදෙන මිලියන ගනන් කම්කරුවන්ට නායකත්වය සම්පාදනය කිරීම සඳහා කේඩරය සූදානම් කල හැක්කේ සංශෝධනවාදයට එරෙහි මෙම අරගලයට පමනි.... 1952 සිට බොහෝ වසර ගනනක් තුල හතර වන ජාත්‍යන්තරයේ ජීවිතයේ හරය වන්නේ පැබ්ලෝවාදයට එරෙහි මෙම ජීවමාන අරගලයත්, එම අරගලයේ පදනම මත කේඩරය සහ පක්ෂ පුහුනු කිරීමත් ය."

1968 ප්‍රධාන පන්ති ගැටුමේ මුවවිට දී, ඕසීඅයිහි ආස්ථානයන්ගේ දේශපාලන පලවිපාක පිලිබඳව එස්එල්එල් විසින් අනතුරු ඇඟවී යː "බටහිර යුරෝපයේ විශේෂයෙන්ම ප්‍රන්සයේ, කම්කරුවන්ගේ රැඩිකලීකරනයක් ක්ෂනිකව සිදුවෙමින් පවතී.... වර්ධනයේ එවැනි අවධියක දී නිරන්තරයෙන් පවතින අන්තරාය වන්නේ විප්ලවවාදී පක්ෂයක් කම්කරු පන්තියේ තත්වයට විප්ලවවාදී ක්‍රමයකින් නොව පැරනි නායකත්වයක් යටතේ කම්කරුවන් ලබා ඇති අත් දැකීම් මගින් කම්කරුවන් තමන්වම සීමා කර ගැනීමේ මට්ටමට හෙවත් නොවැලැක්විය හැකි මූලික ව්‍යාකුලත්වයට අනුගත වීමෙන් ප්‍රතිචාර දක්වීමට නැඹුරු වීම යි. ස්වාධීන පක්ෂය සහ සංක්‍රමන ක්‍රියාමාර්ගය සඳහා කරන අරගලයේ දී එවැනි සංශෝධනයන් සාමාන්‍යයෙන් වෙස් ගන්වන්නේ කම්කරු පන්තියට සමීපවීම, අරගලයේ යෙදෙන සියල්ලන් සමග සමගිය, අවසන් නිවේදන නිකුත් නොකිරීම, ආධානග්‍රාහයෙන් මිදීම ආදිය ලෙසයි."

මෙම අනතුරු ඇඟවීම් බිහිරි කන්වලට නොවැටුනි. 1968 අරගලය නව, අපරිනත සාමාජිකයන් දහස් ගනනක් ඕසීඅයි සහ එහි තරුන සංවිධානය වූ සමාජවාදය සඳහා තරුන පෙරමුන (ඒජේඑස්) වෙතට ඇදී ආ අතර, ඕසීඅයි නායකත්වය, මෙම නව ස්ථරයන්ගේ දේශපාලනික ව්‍යාකුලත්වයට අනුගත විය.

1967 දී එස්එල්එල් විසින් විවේචනයට ලක් කර තිබුනු "එක්සත් පන්ති පෙරමුනක්" සඳහා ඉල්ලීම, දැන් ඕසීඅයි සංවිධානයට තමන් ම සමාජ ප්‍රජාතාන්ත්‍රික නිලධරයට යටත් වීමේත් අලුතින් දිනා ගත් කොටස් පෙරලා පැරනි නිලධාරී තන්ත්‍රයන් වෙත තල්ලු කිරීමේත් සූත්‍රය බවට පත් විය. "එක්සත් පන්ති පෙරමුන" *Union de la gauche* යන්නෙන් ඕසීඅයිය අදහස් කලේ ප්‍රන්සුවා මිතරොංගේ නායකත්වය යටතේ, සමාජවාදී සහ කොමියුනිස්ට් පක්ෂවල සංධානයක් වූ අතර, සංධානයට එරෙහිව වාමාංශයෙන් කෙරෙන සියලු විවේචනයන්ගෙන් එය ආරක්ෂා කරමින් සහයෝගය දීමට ඕසීඅයි කටයුතු කලා ය.

මෙම තතු යටතේ, 1970 ගනන්වල දී සමාජ ප්‍රජාතන්ත්‍ර නිලධරය සඳහා වැදගත් නව "තටාකයක්" ලෙස ඕසීඅයි සංවිධානය වර්ධනය විය. ලයනල් ජොස්පින් වනාහි ඕසීඅයි පාසල හරහා පැමිනි අද්‍යතන සමාජවාදී පක්ෂ නායකයන් බොහෝ දෙනාගෙන් එක් අයෙක් පමනි.

වෘත්තීය සමිති නිලධරය තුලට ද ඕසීඅයි හි වැදගත්කම දැනී තිබුනි. එය වසර ගනනාවක් පුරා, ස්ටැලින්වාදීන් ආධිපත්‍යය දරූ සීජීටී (පොදු කම්කරු සම්මේලනය) තුල ඇති වූ දක්ෂිනාංශික භේදයකින් ඉස්මතුවූ කම්කරු බලය (එෆ්ඕ) නම් වෘත්තීය සමිති එකමුතුවේ නායකත්වය පාලනය කලා ය.

ජොස්පින්ගේ ආන්ඩුව ප්‍රන්ස පාලක ප්‍රභූවේ අපේක්ෂාවන්ට ගැලපෙන පරිදි ක්‍රියා කලේ ය. ජුප්පේට පාලනය කර ගැනීමට නොහැකි වූ සටන්කාමී ව්‍යාපාරය නිරුපද්‍රිතව පාලනය කිරීමට එය ක්‍රියා කලේ ය. මෙය ඉතා පැහැදිලිව දැක ගැනීමට යමෙකු කල යුත්තේ සෑම වසරක ම වැඩ වර්ජන නිසා අහිමි වූ වැඩ දින ගනන සැලකිල්ලට ගැනීම යි. ජුප්පේ ට එරෙහි මහජන ව්‍යාපාරයේ ඉහල ම අදියර වූ 1995 දී එය, මිලියන 5.8ක් වූ අතර, 1997 ජොස්පින් ආන්ඩුවේ ප්‍රථම වසරේ දී එය යන්තම් පන්ලක්ෂයක් විය.

එහෙත් ජොස්පින්ගේ මූලික අපේක්ෂාවන් කටුක ඉච්ඡාභංගත්වයකට මග පෑදී ය. සිය මැතිවරන පොරොන්දු ඉටු කිරීමට අසමත් වූ ඔහුට ඉටු කල හැකි වූයේ නොවැදගත් ඒවා කිහිපයක් පමනි. පැය 35 වැඩ සතියක් නීතිගත කල විට එය, රැකියා නම්‍යතාවය සමගින් අඩු වැටුපු සහ අනාරක්ෂිත රැකියා පැටවීම සඳහා උපකරනයක් බවට පත් විය. 2000 වසර වන විට වර්ජන නිසා අහිමි වුනු දින ප්‍රමානය, පලල් වැඩ වර්ජන වසර වූ 1995 සංඛ්‍යාවෙන් අඩකට වැඩි මිලියන 3.1ක් තෙක් ඉහල නැගුනි.

## 2002 ජනාධිපතිවරනය

ජොස්පින් ට සුදුසු දඬුවම ලැබුනේ 2002 දී ය. ජනාධිපතිවරනයට සති තුනකට පෙර පැවැත්වූ මත විමසුමක දී 70%ක් දෙනා කියා සිටියේ තමන් ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනා වන චිරැක් සහ ජොස්පින් අතර වෙනසක් නො දක්නා බවයි.

සමස්තයක් ලෙස ගත් විට, මොවුන් දෙදෙනාටම ලැබුනේ ඡන්දදායකයන්ගෙන් හතරෙන් කොටසක සහයෝගයක් පමනි. ඡන්ද දායකයන්ගෙන් තුනෙන් එකක් එක්කෝ ඡන්දය දීමට කරදර නොවූහ, නැතහොත් තම ඡන්දය කටු ගා දැමූහ. ජොස්පින්ට යන්තම් 16% ක ඡන්ද ප්‍රතිශතයක් ලැබුනු අතර ඔහුගේ සභාගයේ වඩාත්ම වැදගත් සාමාජිකයා වූ කොමියුනිස්ට් පක්ෂයේ අපේක්ෂකයාට ලැබුනේ 3.4%ක් පමනි. 10%කට වැඩි ප්‍රමානයක "අන්ත වමේ" අපේක්ෂකයන්ට ඡන්දය දුන්හ. මේ සියල්ල අතුරින් වඩාත් සිත් කාවදින කාරනය නම් නව ෆැසිස්ට්වාදී ජාතික පෙරමුනේ අපේක්ෂක ෂොන් මාරි ල පෙන්, ජොස්පින්ට වඩා ඡන්ද ලබාගෙන දෙවන වටයේ දී චිරැක්ගේ ප්‍රධාන ප්‍රතිවාදියා බවට පත්වීමයි.

පලමු වටයේ ප්‍රතිඵල නිවේදනය කිරීමත් සමග ම දහස් සංඛ්‍යාත තරුනයන් ලපෙන්ට එරෙහිව වීදිවලට පැමිනියහ. ජනගහනයේ අනෙකුත් කොටස් දිනකට පසුව එම මාවතට පිලිපන්හ. දිනෙන් දින වර්ධනය වූ විරෝධතා මුලු රට ම අලලා ගති. මුලින් දසදහස් ගනනින් ද, පසුව සිය දහස් ගනනින් ද වසයෙන් විරෝධතාවලට සහභාගිවූවන් ප්‍රමානය, අවසානයේ මැයි පලමුවන දා වන විට මිලියන 2ත් 3ත් අතර ගනනකට නැගුනි. මෑතක දී ප්‍රථම රැකියා නීතියට එරෙහිව ක්‍රියාකාරීව සහභාගි වූ බොහෝ දෙනා තම ප්‍රථම දේශපාලන අත්දැකීම ලද්දේ 2002 දී ය.

මෙම ව්‍යාපාරය පස්වන සමූහාන්ඩුවේ මුලු වියමනට ම තර්ජනය කරන බව පාලක ප්‍රභුව දැන සිටියා හ. තම අභිලාෂයන්ට මුලුමනින් ම ප්‍රතිවිරුද්ධ වූ මැතිවරන ප්‍රතිඵලයක් පිලිගැනීමට මහ ජනතාව සූදානම් නොවූහ.

මැයි පලමුවන දා යෝධ පෙලපාලියට පසුව පැරිසියේ පැවති සිත් ගන්නා සුලු සාකච්ඡාවකට මම සාක්ෂ්‍ය දරමි. සෑම ප්‍රධාන දේශපාලන පක්ෂයක ම නියෝජිතයෙක් මෙන් ම, ප්‍රධාන ප්‍රන්ස බුද්ධිමත්තු - කෙටිකලකට පසුව අගමැති තනතුරට පත් දක්ෂිනාංශික ෂොන් පියරේ රෆාරින්; වෙලඳ පොල හිතවාදී ප්‍රන්ස ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන සංගමයේ (යූඩීඑෆ්) ප්‍රන්සුවා බේරෝ; සමාජවාදී පක්ෂයේ ඩොමිනික් ස්ට්‍රවුස් කාන්; හරිත ජනාධිපති අපේක්ෂක නොයෙල් මැමරේ; දාර්ශනිකයන් වන ඇලේන් ෆින්කිල්ක්‍රෝට් සහ බර්නාඩ් හෙන්රි ලෙවි; ල මොන්ඩේ පුවත්පතේ ප්‍රකාශක එඩ්වි ප්ලෙනෙල් (හිටපු එල්සීආර් සාමාජිකයෙකි) - වේදිකාව අරා සිටියහ. එල්සීආර් සංවිධානය නියෝජනය කලේ ඩැනියෙල් බෙන්සෙඩ් නැමැත්තෙකි.

සියලු දෙනා ප්‍රන්ස රාජ්‍යයේ ආයතනික රාමුව අර්බුදයක ගිලී ඇති බවට ඒක මතික වූ අතර සාකච්ඡාව

කැරකුනේ මෙම අර්බුදයෙන් ගොඩවිත් සමූහාන්ඩුවේ ධනේශ්වර පදනම රැක ගන්නේ කෙසේ ද යන ගැටලුව වටා යි. ඔවුන් සියලු දෙනාම, චිරැක්ට ඡන්දය දෙන ලෙසට ආයාචනය කල අතර ලෙව් අවධාරනය කලේ එසේ කලයුත්තේ තමන්ගේ කැමැත්තට විරුද්ධව නොව "උද්යෝගීමත්ව" බවයි.

පසුව පැමිනි දිනවල මහජන ව්‍යාපාරය, චිරැක් පසුපස ගාල් කිරීම සඳහා පුලුල් උද්ඝෝෂනයක් දියත් කෙරුනි. සටන් පාඨය වූයේ "යමෙක්ට ලපෙන්ව නවතාලීමට අවශ්‍ය නම් චිරැක් තෝරා ගත යුතු ය" යන්නයි. චිරැක්ට ඡන්දය දෙන ලෙස ප්‍රකාශිත බැනරයක් රැගත් සමාජවාදී, කොමියුනිස්ට් සහ ග්‍රීන් පක්ෂ සාමාජිකයන්ගෙන් පෙලපාලි උතුරා ගියේ ය. සමාජවාදී පක්ෂයේ ලාංඡනය සහිතව චිරැක්ගේ ම ඡායාරූපයෙන් සැරසූ ස්ටිකර්වල සඳහන් වූයේ "මම චිරැක්ට ඡන්දය දෙන්නෙමි" යන්නයි.

"වීදිවල සහ ඡන්ද පෙට්ටිවල ලපෙන්ට එරෙහි අරගලය" සඳහා එල්සීආර් කැඳවුම් කල අතර පැවැති කොන්දේසි යටතේ එහි එකම අර්ථය වූයේ චිරැක්ට ඡන්දය දීමයි. බොහෝ කාලයක් රස්තියාදු වෙමින් සිටි එල්ඕ ඡන්දය දීමෙන් වැලකී සිටීමට තීරනය කලේ ය.

වාමාංශය චිරැක්ගේ මැතිවරන උද්ඝෝෂනය දියත් කරන අතර ඔහු මෙම අවස්ථාව දක්ෂිනාංශික කඳවුර ශක්තිමත් කරගැනීමට යොදාගත්තේ ය. විවිධාකාර දක්ෂිනාංශික කැබලි, ජනාධිපතිවරන බහුතරයක් සඳහා වූ සංගමය (යූඑම්පී) නම් නව පක්ෂයක් තුලට රැලි කරගත් ඔහු දෙමසකට පසුව පැවති පාර්ලිමේන්තු මැතිවරනය සඳහා සූදානම් විය. අවසානයේ ඔහු 82% ඡන්ද ප්‍රතිශතයක් සමගින් ජනාධිපති ලෙස පත් වූ අතර ජාතික කවුන්සිලයේ විශාල බහුතරයක් ලබා ගැනීමට යූඑම්පී සමත් විය. ෂෝන් පියරේ රෆාරින් අගමැති තනතුරට පත් වූයේ අභ්‍යන්තර ආරක්ෂාව පිලිබඳ තම "සුපිරි ඇමති" ලෙස නිකොලස් සාකෝසි තෝරා ගනිමිනි.

2002 ජනාධිපතිවරනය පුරා දේශපාලන සිද්ධීන්ට තීව්‍ර ලෙස මැදිහත් වූ *ලෝක සමාජවාදී වෙබ් අඩවිය*, කම්කරු පන්තිය ස්වාධීන දේශපාලන බලවේගයක් ලෙස බලමුලුගැන්විය හැකි බව පැහැදිලි කලා ය.

එල්ඕ, එල්සීආර් සහ පීටී සංවිධාන වෙත විවෘත ලිපියක් ලිවූ අපි, මැතිවරනයේ දෙවැනි වටය වර්ජනය කිරීමේ සංවිධිත කම්කරු පන්තික ක්‍රියාවලියක් සඳහා කැඳවුම් කලෙමු. එවැනි වර්ජනයකින් මැතිවරනයට කිසිදු සුජාතභාවයක් අත් වීම වලකනු හැකිව තිබුනි. ඡන්දයට පසුව එන අනිවාර්ය දේශපාලන අරගල සඳහා හොඳම කොන්දේසි එමගින් නිර්මානය කල හැකිව තිබුනි. මහජනතාවගේ සහ තරුනයන්ගේ දේශපාලනික අධ්‍යාපනය සඳහා එය සුවිශේෂීව වැදගත් ප්‍රතිපාදනයක් වනු ඇත. ඒ තුලින් ඔවුන්ට, චිරැක් පෙනී සිටියේ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාව වෙනුවෙන් ය යන ධනේශ්වර දේශපාලන සංස්ථාපිතයේ බේගල් විනිවිද දැකීමේ හැකියාව ලැබෙනු ඇත.

මැතිවරනයේ පලමු වටයේ දී, ඒකාබද්ධව 10% කට වැඩි ප්‍රතිශතයකට හිමිකම් කියූ අපේක්ෂකයින් සහිත සංවිධාන තුන ම එවැනි ආරම්භකත්වයක් ගැනීම ප්‍රතික්ෂේප කලහ. එල්ඕහි ප්‍රමුඛ අපේක්ෂකයා වූ, ආලේ ලැගුලා අප සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී පැහැදිලි කලේ කිසිවක් කල නොහැකි බවයි - "බල තුලනය" නිවැරදි නොවුනි. දෙවන වටය සම්බන්ධව කිසිදු ප්‍රකාශනයක් කිරීම පීටීය ප්‍රතික්ෂේප කල අතර එල්සීආර් අප සමග කතා කිරීමට සූදානම් නොවුනි.

## 2003 වසන්තයේ විශ්‍රාම වැටුප් ව්‍යාපාරය

බලයට පැමින වසරක් ගතවීමටත් ප්‍රථමයෙන්, 1995 ප්‍රතිරාවයක් බඳු වූ නව මහජන ව්‍යාපාරයකට මුහුන දීමට නව ආන්ඩුවට සිදු විය; 30%ක් දක්වා ප්‍රතිලාභ කප්පාදු කිරීමේ අපේක්ෂාවෙන් , රටෙහි විශ්‍රාම වැටුප් පද්ධතිය "ප්‍රතිසංස්කරනය" කිරීමට මෙන් ම ජාතික අධ්‍යාපන පද්ධතිය විමධ්‍යගත කිරීමට ද එරෙහි මහජන විරෝධතාවකි, එය. ආන්ඩුව විසින් ගනු ලැබූ පසුව සඳහන් පියවර, ඉන් අපහසුතාවට පත් වූ අය විසින් දැකගනු ලැබුවේ, පුද්ගලීකරනය දෙසට ගත් පියවරක් සහ ප්‍රන්සයේ මධ්‍යගත අධ්‍යාපන පද්ධතිය සමග ඓතිහාසිකව බැඳුනු සමානාත්මතා සහ ප්‍රජාතාන්ත්‍රීය වටිනාකම් මත එල්ල වූ ප්‍රහාරයක් ලෙස ය.

දින 8ක් පුරා ක්‍රියාත්මක වූ වර්ජන සහ විරෝධතා මාලාවකට, රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම කම්කරුවෝ මිලියන ගනනක් සහභාගි වූහ. අධ්‍යාපන අංශයේ විරෝධතා දින 12ක් පැවති අතර බොහෝ ගුරුවර ගුරුවරියන් සති ගනනක් පුරා වර්ජනයේ නිරත වූහ.

එහෙත් 1995ට වෙනස් ලෙස ආන්ඩුව මෙවර පසුබැවේ නැත. වෘත්තීය සමිති සම්මේලනයන්ගෙන් විශාලතම එක වන ප්‍රන්ස ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සම්මේලනය (සීඑෆ්ඩීටී) විරෝධතා කඩාකප්පල් කොට, අනෙකුත් වෘත්තීය සමිතිවලින් වෙන්ව ආන්ඩුව සමග සම්මුතියකට එලැඹුනි. වර්ජන දියකර හැරීමේ උපාය අනුගමනය කල සීජීටී හා එෆ්ඕ ව්‍යංගයෙන් ඇඟවුම්කර සිටියේ තම අභිප්‍රාය වනාහි ආන්ඩුව බිඳ වැට්ටවීම නොවන බවයි.

පසුව ජාතික සම්මේලනයේ දී වෘත්තීය සමිති වෙත ප්‍රනාමය පල කල අධ්‍යාපන ලේකම් ප්‍රන්සුවා ෆිලන්, ස්ටැලින්වාදී සීජීටීය සහ එහි ලේකම් බර්නාඩ් තිබෝල්ට්ගේ "වගකීම් සහගත ආකල්පය" හුවා දැක්වී ය. අතිශය "ආතති සහගත අවස්ථාවල දී" පවා සීජීටීය, තමන් "විශ්වාසදායක විපාර්ශ්වයක්" බව පෙන්වා තිබුනි. "පාලනයෙන් ගිලිහී යාමට තර්ජනය කල පොදු

ව්‍යාපාරයක් ව්‍යාප්ත වීම වැලැක්වීමට ක්‍රියා කල මොන්ට්‍රියෙල් වෘත්තීය සමිතියට රැකියා ඇමතිවරයා විසින් කෘතඥතාවේ නයක් ගෙවීමට තිබුනි" යයි ල මොන්ඩේ පුවත්පත ප්‍රකාශ කලේ ය.

මේ වතාවේ දී "අන්ත වාමාංශය" වෘත්තීය සමිති නිලධරය ඉදිරියේ දන ගැසීම 1995ට ද වඩා පැහැදිලි විය. ඔවුන් මොනම පුලුල් ඉදිරිදර්ශනයක් හෝ ප්‍රතික්ෂේප කලහ. "ජෙනරල් ස්ට්‍රයිකයක්" කැඳවූ එල්සීආර්, එසේ කලේ, ආන්ඩුව සමග කිසිදු ගැටුමක් තරයේ ප්‍රතික්ෂේප කල වෘත්තීය සමිති පිලිබඳ සුලු හෝ විවේචනයකින් තොරව ය. එල්ඕව සඳහා එවැනි ඉල්ලීමක් පවා ඕනෑවට වැඩි දෙයකි. ජෙනරල් ස්ට්‍රයිකයක් සඳහා ඉල්ලීම ව්‍යංගයෙන් ප්‍රතික්ෂේප කල එය, වර්ජනය "ව්‍යාප්ත කිරීමේ" ඉල්ලීමත් සමගින් සන්තෘප්තියට පත් විය.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org